# GOVERNMENT
# &
# BUSINESS
# (Part-V)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## පාරිභෝගික ආරක්ෂණය යනු

පාරිභෝගිකයා ගෙවන මුදලට ප්‍රමාණවත් තෘප්තියක් ලබා දීම සහතික කිරීම පිණිස සලසා ඇති නීතිමය ආවරණය පාරිභෝගික ආරක්ෂණය වේ.

## පාරිභෝගික ආරක්ෂණය මෑත කාලයේ අතීතයටත් වඩා අවශ්‍ය වීමට බලපා ඇති හේතු

- වෙළෙඳපොළ තුළ භාණ්ඩ හා සේවා බහුල වීම
- තරඟකාරිත්වය වැඩි වීම නිසා වෙළෙඳපොළ තුළ විෂමාචාර ඇති වීමට ඉඩ වැඩි වීම
- නිදහස් වෙළෙඳාම සමඟ වෙළෙඳපොළ සංකීර්ණ වීම
- ගෝලීයකරණය සමග ඇති විය හැකි සමාජ හා සංස්කෘතික පිරිහීම
- පරිසරය දූෂණය වීම වැළැක්වීම සඳහා පාරිභෝගිකයින් දැනුවත් කිරීම අවශ්‍ය විම

ClassWork.LK

# පාරිභෝගික ආරක්ෂණයෙන් පාරිභෝගිකයාට හා ව්‍යාපාරිකයාට අත් වන වාසි

## පාරිභෝගිකයාට

- ගෙවන මුදලට සරිලන වටිනාකමක් ලැබෙන භාණ්ඩ පාරිභෝජනයට අවස්ථාව ලැබීම

- වෙළෙඳ විෂමාචාරවලින් ආරක්ෂා වීම

- ගුණාත්මක භාණ්ඩ හා සේවා පාරිභෝජනය නිසා පාරිභෝගික සෞඛ්‍යය හා ආරක්ෂාව තහවුරු වීම

- අවශ්‍ය අවස්ථාවල දී පාරිභෝගික ආරක්ෂණය නිසා නීතිමය රැකවරණ ලබා ගත හැකි වීම

- පාරිභෝගිකයාට ජීවත් වීමට සුදුසු පරිසර තත්ත්වයන් උදා වීම

ClassWork.LK

## වයාපාරිකයාට

- ගුණාත්මක තත්ත්වයෙන් යුක්ත භාණ්ඩ සැපයීම නිසා පාරිභෝගික විශ්වාසය දිනා ගත හැකි වීම

- ව්‍යාපාරිකයාගේ පිරිවැටුම වැඩි වීම තුළින් ලාභය ඉහළ යාම

- ප්‍රමිතියකට අනුව නිෂ්පාදනය කිරීම නිසා අපතය අඩු වීම

- අයහපත් තරඟ විරෝධී ක්‍රියා නො මැති වීමෙන් යහපත් ව්‍යාපාර පරිසරයක් ඇති වීම

ClassWork.LK

## පාරිභෝගික අයිතිවාසිකම්

අන්තර්ජාතික වශයෙන් පිළිගත් පාරිභෝගික අයිතිවාසිකම් කිහිපයක් වර්තමානයේ ක්‍රියාත්මක වේ.

### ඇමරිකා එක්සත් ජනපදයයේ හිටපු ජනාධිපතිවරයෙකු වූ ජෝන් එෆ්. කෙනඩි විසින් ප්‍රකාශයට පත්කර ඇති පාරිභෝගික අයිතිවාසිකම්

- ආරක්ෂාව සලසා ගැනීමේ අයිතිය
- තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය
- තෝරා ගැනීමට ඇති අයිතිය
- සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතිය

### පාරිභෝගික ජාත්‍යන්තරය විසින් ප්‍රකාශයට පත්කර ඇති පාරිභෝගික අයිතිවාසිකම්

- මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය
- වන්දි ලබා ගැනීමට ඇති අයිතිය
- පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය
- සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත් වීමට ඇති අයිතිය

ඉහත සඳහන් පාරිභෝගික අයිතිවාසිකම් අට අන්තර්ජාතික වශයෙන් පිළිගත් පාරිභෝගික අයිතිවාසිකම් වේ.

ClassWork.LK

# පාරිභෝගික වගකීම්

පාරිභෝගික අයිතිවාසිකම් මෙන් ම පාරිභෝගික වගකීම් ද පාරිභෝගිකයා සතු වේ.

- විචාරාත්මක දැනුවත්භාවය
- සක්‍රීය සහභාගිත්වය
- සමාජය ගැන සැලකිලිමත් වීම
- පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම
- සහයෝගීතාව

දැනුවත්භාවකින් යුත් පාරිභෝගිකයා ගෙවන මුදලට සරිලන වටිනාකමකින් යුත්, ප්‍රමිතියෙන් ඉහළ භාණ්ඩ තෝරා ගැනීමට පෙළඹේ.

එසේ ම වෙළෙඳ විෂමාචාර හා පාරිභෝගික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ ව අදාළ බලධාරීන් දැනුවත් කර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරයි.

තවද, තමා ජීවත්වන පරිසරය ආරක්ෂා කර ගනිමින්, සමාජය පිළිබඳ සැලකිලිමත් වෙමින්, සහයෝගයෙන් කටයුතු කරමින්, තාර්කික පාරිභෝගිකයෙකු ලෙස වෙළෙඳපොළේ හැසිරෙයි.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura